අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/04/60/07/44/බඳවා ගැනීම 2018/2019(II)-01

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2023.05.

.................................................................
.................................................................
.................................................................
.................................................................

**<u>අංක 1885/31 හා 2014.10.22 දින දරන නව විදුහල්පති සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව 2018/2019 සීමිත තරඟ විභාගය සමත් අයදුම්කරුවන්ගෙන් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම - II අදියර (2023)</u>**

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ බඳවා ගැනීම් සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද අංක SC 93/2021(F/R), SC 40/2022(F/R), SC 26/2022(F/R), SC 476/2019(F/R) යන නඩු කටයුතු සමථයට පත් කිරීමට අදාළ 2022.12.12 දිනැති සමථ නඩු තීන්දුව ප්‍රකාරව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සේවා ව්‍යවස්ථානුකූලව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වූ සාමාන්‍ය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ඔබ කැඳවනු ලබන බව සතුටින් දන්වා සිටිමි.

02. ඒ අනුව උක්ත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත දැක්වෙන නියමිත දිනය හා වේලාව අනුව, බත්තරමුල්ල, ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ 4 වන මහලේ ශ්‍රවණාගාරයට පැමිණෙන ලෙස කාරුණිකව දන්වා සිටිමි (මීට අදාළ නාමලේඛනය 2023.05.08 දිනැතිව www.moe.gov.lk යන අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කර ඇත).

දිනය :
වේලාව :
සම්මුඛ පරීක්ෂණ මණ්ඩල අංකය :
සම්මුඛ පරීක්ෂණ කැඳවීම් අංකය :

03. එදිනට පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් හා සේවා පළපුරුද්දට අදාළ ලිපි ලේඛන වල මුල් පිටපත් හා එම ලේඛනයන්හි කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කරන ලද ඡායා පිටපත් වෙන වෙනම ලිපි ගොනු දෙකක රැගෙන එන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි. ඡායා පිටපත් ගොනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවන දිනට අදාළ ගොනු වර්ණයෙන් යුක්ත විය යුතුය.
(අංක I සිට VI දක්වා වන ලේඛන **පමණක්** සියලුම දෙනා විසින් අනිවාර්යෙන්ම රැගෙන ආ යුතු අතර, අංක VII සිට XI දක්වා ඇති 2018.06.01 දිනට සපුරා ඇති අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් වලින් ඔබට අදාළ වන සුදුසුකම් වල සහතික පමණක් ඉදිරිපත් කල යුතුය.)

I. ජාතික හැඳුනුම්පත
II. උප්පැන්න සහතිකයේ අනු පිටපතක් (නමෙහි වෙනස්කම් ඇත්නම් දිවුරුම් ප්‍රකාශයක්)
III. සේවා සහතිකය (වර්තමාන සේවා ස්ථානයෙන් ලබා ගත යුතුය)
IV. ශ්‍රී ලංකා ගුරු සේවයේ මුල් පත්වීම් ලිපිය
V. ගුරු සේවයේ ස්ථිර කරන ලද ලිපිය
VI. විධිමත්ව සම්පූර්ණ කරන ලද කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ වාර්තාව මේ සමඟ ඇති ඇමුණුම 01හි ආකෘති පත්‍රය අනුව රැගෙන ආ යුතුය. (අදාළ වාර්තාවේ ඔබ සම්බන්ධයෙන් වන තොරතුරු හා ඔබගේ සුදුසුකම් වලට අදාළ තොරතුරු නිවැරදිව හා උපදෙස් ප්‍රකාරව සම්පූර්ණ කර ඇත්දැයි පරීක්ෂා කර බලා ඉදිරිපත් කල යුතුය.)
VII. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ජාතික අධ්‍යාපන ආයතනයෙන් පිරිනමනු ලැබූ අධ්‍යාපනවේදී උපාධිය පිළිබඳ සහතිකය

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk

VIII. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පිළිගත් ඕනෑම විෂයය ක්ෂේත්‍රයක උපාධිය පිළිබඳ සහතිකය
IX. පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව පිළිබඳ සහතිකය
X. ගුරු පුහුණු සහතිකය
XI. ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව පිළිබඳ සහතිකය

04. ඉහත 03 ඡේදයෙහි දක්වා ඇති සියලුම ලේඛන සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදීම ඉදිරිපත් කල යුතු අතර, පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු ලේඛනයක් භාරගනු නොලැබේ.

05. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී මූලික සුදුසුකම් සපුරාලන නිලධාරීන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට යොමු කරනු ලබන අතර ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී විදුහල්පති කාර්යභාරයට අදාළ මාතෘකාවක් ඔස්සේ වාචිකව ඉදිරිපත් කිරීමක් කළ යුතුය. එම ඉදිරිපත් කිරීම සඳහා ලබා දෙන උපරිම කාලය විනාඩි 05ක් වේ. මේ සඳහා අවශ්‍ය නම් පරිශීලන ග්‍රන්ථ රැගෙන ඒමේ අවස්ථාව ඇත. අදාළ වාචික ඉදිරිපත් කිරීම සකස් කරගත් පූර්ව සැලැස්මකට අනුව ඉදිරිපත් කළ හැක. ඔබගේ ඉදිරිපත් කිරීම සඳහා පුවරු (White board සහ White board markers) පමණක් ආධාරක වශයෙන් ලබා දෙන අතර, එම ඉදිරිපත් කිරීම සඳහා ලකුණු ලබාදීමේ දී පහත සඳහන් නිර්ණායක කෙරෙහි අවධානය යොමු කරන බව වැඩිදුරටත් සඳහන් කරමි.

I. හැඳින්වීම - (ලකුණු 04)
II. ඉදිරිපත් කිරීමේ සැලැස්ම - (ලකුණු 04)
III. ඉදිරිපත් කිරීමේ කුසලතාවය - (ලකුණු 08)
IV. විෂය දැනුම - (ලකුණු 05)
V. කාල කළමනාකරණය - (ලකුණු 04)

06. සම්මුඛ පරීක්ෂණයට පැමිණීම වෙනුවෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

07. මෙම සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමම පමණක් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියේ පත්වීමක් ලැබීම සඳහා හිමිකමක් නොවන බව ද තවදුරටත් දන්වා සිටිමි.

එම්.එන්.රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

සටහන:

1. ඔබට නියමිත දින නියමිත වේලාවට සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම අනිවාර්යය වේ. අධ්‍යාපන හා සේවා පළපුරුද්ද සනාථ කිරීමට අදාළ ලේඛනයන්හි මුල් පිටපත් හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කරන ලද එම ලිපිවල ඡායා පිටපත් ඉහත අංක 03 හි I සිට XI දක්වා සඳහන් පරිදි අනුපිළිවෙලට ගොනු කර එම ගොනුවේ ඉදිරිපස ඔබගේ **නම, ජාතික හැඳුනුම්පත් අංකය, කැඳවීම් අංකය හා විභාග අංකය** සඳහන් කර රැගෙන එන මෙන් ඉතා ඕනෑකමින් දන්වමි.
2. සම්මුඛ පරීක්ෂණ අවස්ථාවෙන් පසුව කිසිදු හේතුවක් මත ඉහත කිසිදු ලේඛනයක් සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කළ නොහැකි බව අවධාරණය කරමි.
3. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන නිලධාරීන්ගේ නාමලේඛනය ඇතුලත් උපලේඛනය අනුව නියමිත දිනයන්හිදී සහභාගීවන නිලධාරීන් අදාළ ලේඛනවල ඡායාපිටපත් ඇතුලත් ගොනුව එම දිනයට අදාළ වර්ණයෙන් රැගෙන ආ යුතුය.

ගොනුවල වර්ණ අනුපිළිවෙලින් : සුදු. රෝස,කහ,රතු,කොළ,තැඹිලි,නිල්,දම්,කළු,අළු